*සැ. යු.* - 2018.08.31 දින පළ වූ අංක 2,087 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,088 - 2018 සැප්තැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.09.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1358 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1372 | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් අලාභ අය කරගැනීමේ පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 31 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තම්බර් මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## ජා ඇල ප්‍රාදේශීය සභාව - කඳාන

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, ජා ඇල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියැදුරු III | 03 | PL-3-2016 රු. 25,790 – 10x270 – 10x300 – 10x330 – 12x350 – රු. 38,990/- | ***අධ්‍යාපන සුදුසුකම් :***<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් අවම වශයෙන් සමත් වී තිබිය යුතුය.)<br><br>***වෘත්තීය සුදුසුකම්***<br>1. බර වාහන රියැදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් එනම්, 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී1' පන්තියේ බලපත්‍රයක් *නැතහොත්* තාර බර හොණ්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.<br><br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br><br>***පළපුරුද්ද***<br>බලපත්‍රය ලැබීමෙන් පසු රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>***කායික සුදුසුකම්***<br>අවම උස අඩි 05ක් විය යුතුය.<br>දිවා කාලයේ සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br><br>***බඳවා ගැනීමේ ක්‍රමය***<br>වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.<br><br>***වෘත්තීය පරීක්ෂණය :-***<br>දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියකුගෙන්ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය, මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම, මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | මෝටර් කාර්මික (ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය) | 01 | PL-2-2016 රු. 25,250 – 10x270 – 10x300 – 10x330 – 12x350 – රු. 38,450/- | *තනතුරට අදාළ රාජකාරි*<br>පෙට්‍රල් / ඩීසල් වාහන හා යන්ත්‍ර සූත්‍රවල දෝෂ හඳුනා ගැනීම, යන්ත්‍ර සූත්‍ර හා වාහන අළුත්වැඩියා කිරීම හා නඩත්තුව.<br><br>සීමිත බඳවා ගැනීම :<br><br>*අධ්‍යාපන සුදුසුකම්*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.)<br><br>*වෘත්තීය සුදුසුකම්*<br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතු ය.)<br><br>*පළපුරුද්ද*<br>පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය වසර 05 ක් සපුරා ඇති සේවකයකු විය යුතු ය.<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරෙන අතර, එහි දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.)<br><br>(*සැ.යු.* :- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පිරවීමට නොහැකි වන අවස්ථාවල දී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩුව පුරවනු ලැබේ.)<br><br>විවෘත බඳවා ගැනීම :<br><br>*අධ්‍යාපන සුදුසුකම්*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතු ය.) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *වෘත්තීය සුදුසුකම් :*<br><br>අදාල තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන-කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, සාමාන්‍ය දැනීම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 03 | විදුලි කාර්මික (ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය) | 01 | PL-2-2016 රු. 25,250 – 10x270 – 10x300 – 10x330 – 12x350 – රු. 38, 450/- | *තනතුරට අදාල රාජකාරි* :- සියළුම විදුලි ස්ථාපන කටයුතු, විදුලිය බෙදා හැරීම, විදුලි සේවා නඩත්තුව, විදුලි උපකරණ හා යන්ත්‍ර නඩත්තු කිරීම.<br><br>**සීමිත බඳවා ගැනීම :-**<br><br>*අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br>අදාල තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතුය)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදාල ප්‍රායෝගික දැනුම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.)<br><br>(සැ.යු. :- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පිරවීමට නොහැකි වන අවස්ථා වලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩුව පුරවනු ලැබේ.) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *විවෘත බඳවා ගැනීම :-*<br><br>*අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br>අදාල තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.<br>(සහතික මගින් සනාථ කළ යුතුය)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, සාමාන්‍ය දැනීම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 04 | ඖෂධ සංයෝජක | 01 | PL-2-2016 රු. 25,250 – 10x270 – 10x300 – 10x330 – 12x350 – රු. 38,450/- | *අධ්‍යාපන සුදුසුකම් :*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් වී තිබිය යුතුය.)<br><br>*පළපුරුද්ද :*<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ රජය විසින් පිළිගත් ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක වසරකට නොඅඩු කාලයක ක්ෂේත්‍රයට අදාල සේවා පළපුරුද්ද ලබා තිබීම.<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 05 | කාර්යාල කාර්යය සහායක | 02 | PL-1-2016 රු. 24,250 – 10x250 – 10x270 – 10x300 – 12x330 – රු. 36,410/- | *අධ්‍යාපන සුදුසුකම්*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් අවම වශයෙන් සමත් වී තිබිය යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා ද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 06 | මුරකරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 03 | PL-1-2016 රු. 24,250 – 10x250 – 10x270 – 10x300 – 12x330 – රු. 36,410/- | *අධ්‍යාපන සුදුසුකම්*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් අවම වශයෙන් සමත් වී තිබිය යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්,ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 07 | පුස්තකාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | PL-1-2016 රු. 24,250 – 10x250 – 10x270 – 10x300 – 12x330 – රු. 36,410/- | *අධ්‍යාපන සුදුසුකම්*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් අවම වශයෙන් සමත් වී තිබිය යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 08 | සෞඛ්‍ය කම්කරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 03 | PL-1-2016 රු. 24250 – 10x250 – 10x270 – 10x300 – 12x330 – 36410/- | ***අධ්‍යාපන සුදුසුකම්***<br><br>අවම වශයෙන් 08 ශ්‍රේණිය / 09 වසර සමත් විය යුතුය.<br><br>***බඳවා ගැනීමේ ක්‍රමය***<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්), තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික, ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 09 | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 06 | PL-1-2016 රු. 24,250 – 10x250 – 10x270 – 10x300 – 12x330 – රු. 36,410/- | **අධ්‍යාපන සුදුසුකම්**<br><br>අවම වශයෙන් 08 ශ්‍රේණිය / 09 වසර සමත් විය යුතුය.<br><br>**බඳවා ගැනීමේ ක්‍රමය**<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්), තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික, ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |

01. *නියමිත තනතුරු සඳහා වෙනත් පොදු සුදුසුකම් :*

i. අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් ඇත්තෙකු විය යුතු ය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

iii. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

iv. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ බස්නාහිර පළාත තුළ ඕනෑම ස්ථානයක සේවය කළ හැකි මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරණු ලැබූවෙකු හෝ රජයේ, පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

i. ඒ ඒ බඳවා ගැනීම් පටිපාටි, සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ, වෘත්තීය පරීක්ෂණ, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

ii. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2018.09.21 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ජා ඇල ප්‍රාදේශීය සභාව, කඳාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.)

iii. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉදිරි කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

iv. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික (අදාල පරිදි)
(ඇ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික (අදාල පරිදි)

03. සේවයේ නියුක්ත කර වීමේ කොන්දේසි :- මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. නමුත් ඒ සම්බන්ධයෙන් රජය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් ය.

04. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ජා ඇල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථාකාලයේ දී වෘත්තීය පරීක්ෂණ/ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

06. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව වැටුප් ක්‍රම දක්වා ඇති අතර, ගෙවීම් කිරීම එහි චක්‍රලේඛයේ උපලේඛන II අනුව සිදු කෙරේ.

(දෙමළ, ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට සැලකිය යුතුය.)

කේ. එච්. කපිල කුමාර,
ලේකම්,
ජා ඇල ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 31 වැනි දින,
ජා ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

ජා ඇල ප්‍රාදේශීය සභාවේ ........................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය

01. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————————————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————.

03. ස්ථිර ලිපිනය :——————————————————.

04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————————.

05. ස්ත්‍රී / පුරුෂ භාවය :——————————————————.

06. උපන් දිනය ඃ- වර්ෂය :—————— මාසය:—————— දිනය :——————

07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ- අවුරුදු :—————— මාස:—————— දින:——————

08. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ පරම්පරාවෙන් ද, ලියාපදිංචියෙන් ද යන වග ඃ-

09. විවාහක / අවිවාහක බව :——————————————————.

10. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————————.

11. දුරකතන අංකය :——————————————————.

12. අධ්‍යාපන සුදුසුකම් :——————————————————.

(සහතික පිටපත් ඇමිණිය යුතුය)

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————————.

(සහතික පිටපත් ඇමිණිය යුතුය)

14. සේවා පළපුරුද්ද :——————————————————.

15. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරුවෙකු වී ඇත්නම් එම වරදට ලැබූ දඬුවම් පිළිබඳ විස්තරයක් සඳහන් කරන්න :——————————————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

——————————.

අයදුම්කරුගේ අත්සන

දිනය ඃ .........................

*ආයතන ප්‍රධානියාගේ නිර්දේශය (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා)*

.................................. දින මා ඉදිරිපිට අත්සන් තැබූ ..................................................................................... මයා / මිය / මෙනවිය, .... .................................................................. දින සිට ..................................................................................වේ (ආයතනයේ නම) ......................... .................................................. ලෙස (දරන තනතුර) සේවය කරන අතර, ........................................................... තනතුර සඳහා සුදුසු බව නිර්දේශ කරමි. ඒ සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හැරීමට හැකි බව සහතික කරමි.

——————————.

ආයතන ප්‍රධානී

(නිල මුද්‍රාව)

දිනය ඃ .........................

09 - 449

## ගාල්ල මහා නගර සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගාල්ල මහා නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | සේවා ගණය සහ ශ්‍රේණිය | මාසික වැටුප් පරිමාණය | බඳවාගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්, අමතර සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | විරී පහන් ක්‍රියාකරු<br>ආදාහනාගාර සහායක<br>උද්‍යාන භාරකරු<br>පුස්තකාල සහායක<br>ආයුධ උපකරණ භාරකරු<br>ගස් කැපුම්කරු | 01<br>01<br>01<br>01<br>01<br>01 | ප්‍රාථමික- ශිල්පීය නොවන (III) | PL-01-2016<br>රු. 24,250-250x10- 270x10-300x10-330x12-36,410/- (රා.ප.ච. 3/2016 අනුව)<br>*සැ.යු:-* රා.ප.ච. 3/2016හි උපලේඛන II අනුව වැටුපේ පිහිටුවනු ලැබේ. | අධ්‍යනය පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය. |
| 7.<br>8. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු<br>සෞඛ්‍ය කම්කරු | 28<br>03 | ප්‍රාථමික- ශිල්පීය නොවන (III) | PL-01-2016<br>රු. 24,250-250x10- 270x10-300x10-330x12-36,410/- (රා.ප.ච. 3/2016 අනුව)<br>සැ.යු:- රා.ප.ච. 3/2016හි උපලේඛන II අනුව වැටුපේ පිහිටුවනු ලැබේ. | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම |
| 9. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | ප්‍රාථමික- අර්ධ ශිල්පීය (III) | PL-02-2016<br>රු. 25,250-270x10- 300x10-330x10-350x12-38,450/- (රා.ප.ච. 3/2016 අනුව)<br>සැ.යු:- රා.ප.ච. 3/2016හි උපලේඛන II අනුව වැටුපේ පිහිටුවනු ලැබේ. | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම.<br><br>අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 10. | පෙදරේරු | 06 | ප්‍රාථමික- අර්ධ ශිල්පීය (III) | | |
| 11. | වඩු කාර්මික | 01 | ප්‍රාථමික- අර්ධ ශිල්පීය (III) | | |
| 12. | පැස්සුම්කරු | 01 | ප්‍රාථමික- අර්ධ ශිල්පීය (III) | | |

02. *වයස් සීමාව:-*

i. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
ii. දැනට රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

03. *පොදු සුදුසුකම්:-*

i. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
ii. අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.
iii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වැරදිකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය.
v. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් අදාල තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *පොදු කොන්දේසි:-*

i. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය ගාල්ල මහා නගර සභාවේ ගරු නගරාධිපති සතුය.
ii. තෝරාගනු ලබන අයදුම්කරුවන් මාස 03ක් ඇතුළත රජයේ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේ දී ශාරීරික හා මානසික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරන ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
ii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

06. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් 2013.04.16 දින අනුමත කරන ලද අංක 239 දරන දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කනිෂ්ඨ සේවක සේවයේ ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන සේවා ගණයන්ට අදාළ බඳවා ගැනීම් පටිපාටියේ නියෝගවලට හා ඒවාට වරින්වර නිකුත් කරන රෙගුලාසි හා සංශෝධනයන්ට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

07. *බඳවාගැනීමේ ක්‍රමය :*

සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

08. *සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය*

| | *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2 | අමතර/වෘත්තීය සුදුසුකම් (ඉල්ලා ඇත්නම් පමණි) | 10 | |
| 3 | පළපුරුද්ද (ඉල්ලා ඇත්නම් පමණි) | 10 | |
| 4 | ගාල්ල සහා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 05 බැගින්) | 45 | |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| | එකතුව | 100 | |

09. *අයදුම්පත් එවිය යුතු ආකාරයඃ-*

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ මාස 06ක් තුළ දී ලබා ගත් ග්‍රාමසේවා සහතිකය),
4. සාපරාධී වරදක් සම්බන්ධයෙන් මෙතෙක් උසාවියකින් වරදකරුවකු කර නැති බව හා එවැනි වරදක් සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයකට භාජනය වූ අයෙකු නොවන බවට තහවුරු කරන පොලිස් සහතිකයක් ,
5. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්,
6. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2018.09.28 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ''නාගරික කොමසාරිස්, මහා නගර සභාව, ගාල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. (අයදුම්පත්‍ර A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස්කර ඉදිරිපත් කළ යුතු ය.) අසම්පූර්ණ අපහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් සිය අයදුම්පත් යොමු කළ යුතුය.

10. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

නගරාධිපති,
ගාල්ල මහා නගර සභාව.

2018 අගෝස්තු මස 15 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

| කාර්යාලීය ප්‍රායෝජන සඳහා |
|---|
| |

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ගාල්ල මහා නගර සභාව***

01. මුලකුරු සමග නම :————————————.

මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.

02. ස්ථිර ලිපිනය :————————————.

03. දිස්ත්‍රික්කය :————————————.

04. උපන් දිනයඃ වර්ෂය :———— මාසය:———— දිනය :————

05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————

06. දුරකථන අංකය :————————————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————————————

08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :————————————

අවුරුදු :———— මාස:———— දින:————

09. විවාහක/අවිවාහක බව :————————————.

10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන වග:————————

11. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර)ඃ

(i) අධ්‍යාපනය ලැබූ පාසල් :——————————

(ii) සමත් වූ වසර/ශ්‍රේණිය :——————————

(iii) අ.පො.ස (සා/පෙළ) විභාගය :

විභාග අංකය :——————————

විභාග වර්ෂය හා මාසය :——————————

සමත් වූ විෂයයන් ඃ

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි)

. ..................................................................................................................................................................................................

..................................................................................................................................................................................................

13. අයදුම්කරු සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනක හෝ අධිකරණයෙන් වරදකරුවකු කර ඇත් ද? :——————————
එසේ නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර :——————————

14. චරිත සහතික දී ඇති පුද්ගලයින් දෙදෙනාගේ නම් සහ පදවි නාම

1. .................................................................................... ....................................................................................
2. .................................................................................... ....................................................................................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

..................................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

(මෙම කොටස අදාල වන්නේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ සේවය කරන .......................................................................... මයා/මිය/මෙනවිය දැනට ................................ තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකිය.

ආයතන ප්‍රධානියාගේ අත්සන :——————————.
දිනය :——————————.
නිල මුද්‍රාව :——————————.

09 - 28

## දෙවිනුවර ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික හා සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

### උපලේඛනය

| *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| (01) සෞඛ්‍ය කම්කරු (III පන්තිය) | 04 | PL1 / 2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |
| (02) වැඩ ක්ෂේත්‍ර කම්කරු (III පන්තිය) | 01 | PL1 / 2016 | රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | 08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා පොදු කොන්දේසි :*

1. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාව මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකල්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තාවූ සිය තනතුරු අත්හැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතුය.
2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු නොවිය යුතුය.
3. යම් අපරාධ නීති කෘත්‍යයකදී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයේ දී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
4. වස්තු භංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතුය.
5. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
6. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
7. 2018.09.28 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
8. අයදුම්පත භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමැතිය තබා පදිංචිය සනාථ කළ යුතුය.)
9. මෙම බඳවා ගැනීම අයදුම්පත් කැඳවන අවස්ථාවේදී හෝ ඊට පසුව අතරමගදී හෝ අතහැර දැමීමට දෙවිනුවර ප්‍රාදේශීය සභාවට බලය ඇත.

*විශේෂ සුදුසුකම් :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

*සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

(01) දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

*ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි ඒ4 ප්‍රමාණයේ කොළයක සකස් කරන ලද අයදුම්පත් 2018.09.28 වැනි දිනට පෙර ලැබෙන සේ "සභාපති, දෙවිනුවර ප්‍රදේශීය සභාව, දෙවිනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම් දෙවිනුවර ප්‍රදේශීය සභාවේ ලේකම් වෙත අතින් භාර දී එය භාරදුන් බවට සනාථකර ගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම්පස කෙළවරේ ..... (ඉල්ලුම් කරන තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය.

සුජීව වෙදගේ,
සභාපති.

2018 අගෝස්තු මස 17 වැනි දින,
දෙවිනුවර ප්‍රදේශීය සභාව,
දෙවිනුවර.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික හෝ පාසල් හැරයාමේ සහතිකය,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
4. මෑතකදී ලබාගත් ග්‍රාමනිලධාරී සහතිකය,
5. මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්,
6. වෙනත් සුදුසුකම් හෝ සේවා පලපුරුද්ද පිළිබඳ සහතික,
7. විශේෂ සුදුසුකම් පිළිබඳ සහතික

**ආදර්ශ අයදුම් පත්‍රය**

*දෙවිනුවර ප්‍රාදේශීය සභාව - දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුර සඳහා බඳවා ගැනීම 2018* ............................... තනතුර

01. *(අ)* මුලකුරු සමග නම :——————————————————.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————..

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————————.

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය :——————————————————.

04. ස්ථිර ලිපිනය :——————————————————.

05. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————————————.

06. විවාහක/ අවිවාහක බව :——————————————————.

07. උපන් දිනය :——————————.

2018.09.14 දිනට වයස අවු :——————. මාස :—————— දින :——————

08. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————————.

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද:——————————————.

10. අධ්‍යාපන සුදුසුකම් :——————————————————.

11. වෙනත් සුසුකම් :——————————————————.

12. වෘත්තීය සුදුසුකම් :——————————————————.

13. විශේෂ සුදුසුකම් :——————————————————.

14. සේවා පළපුරුද්ද :

I. දැනට සේවය කරන ආයතනය :——————————————.

II. දැනට දරන තනතුර :——————————————.

III. ඔබ තනතුරට පත් වූ දිනය :——————————————

IV. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————————

15. අධිකරණය ඉදිරියේ ඔබ වරදකරුවකු වී ඇද්ද? / ඔව් / නැත :——————————————

මෙහි සඳහන්කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මා තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බව මම දනිමි.

.................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................

09 - 29

---

# පළාත් පාලන නිවේදන

## නිවැරදි කිරීමයි

### මාවතගම ප්‍රාදේශීය සභාව

2018.07.26 දින පළ කරන ලද *ගැසට්* අංක 2082 හි 07-721 නිවේදනයේ උපලේඛනය වැරදි ලෙස පළ වී ඇත.

එම උපලේඛනය පහත සඳහන් අයුරින් නිවැරදි විය යුතුය.

එස්. කේ. අනුර කමල් පෙරේරා.
සභාපති,
ප්‍රාදේශීය සභාව - මාවතගම.

2018 ජුනි මස 25 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*වැරදියට පළ වී ඇති ආකාරය :*

01. වටරක කොට්ඨාසය 661 - උඩ ඉගුරුවත් ග්‍රාම නිලධාරී වසම
ආරම්භය - උග්ගල්පාය උඩතැන්න හරහා මාවතගම

*නිවැරදි විය යුතු ආකාරය :*

01. උඩ ඉගුරුවත්ත ග්‍රාම නිලධාරී වසම

ආරම්භය : උඩ ඉගුරුවත්ත පී. ජී. තිලකරත්න මහතාගේ නිවස ඉදිරිපිට

09 - 30

## නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම

2018.05.25 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 10 යටතේ පහත සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථා නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව පිළිගෙන වැළඳ ගැනීමට තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

I. 1988.08.23 වැනි දින අංක 520/7 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව
II. 1992.08.28 වැනි දින අංක 730 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව

කේ. කේ. රවී,
සභාපති,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 16 වැනි දින,
නෝර්වුඩ් ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-86

---

## කුරුණෑගල මහ නගර සභාව

2019 වර්ෂය සඳහා දේපල බද්ද

මහ නගර සභා ආඥාපනතේ 230 වගන්තිය යටතේ (252 අධිකාරය) හා එම වගන්තියේ සඳහන් සීමාවන්ට සහ නිදහස් කිරීම්වලට යටත්ව කුරුණෑගල මහ නගර සභාවේ පාලන සීමාව තුළ තිබෙන සියලුම නේවාසික ස්ථානවලට වාර්ෂික වටිනාකම්වලින් සියයට පහක (5%) බද්දක් ද වෙළෙඳ හා වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන, ඉඩම්වලට හා ගෙපත්වලට වාර්ෂික වටිනාකම් වලින් සියයට හයක (6%) බද්දක් 2019 වර්ෂය සඳහා පැනවීමට කුරුණෑගල මහ නගර සභාව විසින් තීරණය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. තවද 2019 වර්ෂයේ නව තක්සේරු ප්‍රතිශෝධන ක්‍රියාත්මක වේ. ඒ සඳහා බදු නිවේදන නිකුත් කරනු ලැබේ. මෙම බද්ද පිළිවෙලින් 2019 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 දිනවල හෝ ඊට ප්‍රථම හෝ සමාන කොටස් හතරකින් ගෙවිය යුතු වේ.

තව ද, 1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධන) පනතින් මහ නගර සභා ආඥාපනතේ 230 හා 255 වගන්තිවලට කරන ලද සංශෝධනයන් අනුව 2018 වර්ෂය සඳහා ගෙවිය යුතු මුළු වරිපනම් බද්ද, 2019 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් එම වර්ෂය සඳහා වූ වාර්ෂික වරිපනම් බද්දෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද සෑම කාර්තුවක් වෙනුවෙන්ම ගෙවන්නේ නම් එම කාර්තුවේ වරිපනම් බද්දෙන් සියයට පහක (5%) වට්ටමක් ද අඩු කරනු ලබන අතර, නියමිත දිනවලට පසුව ගෙවනු ලබන වරිපනම් බදු සඳහා පහත සඳහන් අන්දමට වරෙන්තු ගාස්තු අඩු කරනු ලබන බවද වැඩි දුරටත් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| නිවාස ස්ථානවලින් හා මුඩු ඉඩම් වලින් | - | 15% |
| මුඩු ඉඩම් හා නිවාස නොවන අනෙකුත් සෑම ස්ථානයකින්ම | - | 20% |
| සංවර්ධනය නොකළ ඉඩම්වලින් | - | 20% |

ප්‍රදීප් තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
කුරුණෑගල.

2018 අගෝස්තු මස 15 වැනි දින

09 - 116/1

## කුරුණෑගල මහ නගර සභාව

2019 වර්ෂය සඳහා වරිපනම් පොත

2019 වර්ෂය සඳහා මෙම නගර සභාවේ වරිපනම් පොත සාමාන්‍ය කාර්යාලයීය වේලාවන්හි දී පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ දැන් සූදානම්ව ඇති බව මහ නගර සභා ආඥාපනතේ (252) අධිකාරය 235 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ප්‍රදීප් තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
කුරුණෑගල.

2018 අගෝස්තු මස 15 වැනි දින.

09 - 116/2

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 අප්‍රේල් 27 දින අංක 2069 දරන පළාත් සභා *ගැසට් පත්‍ර* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍රය* මගින් ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, එම *ගැසට්* නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දී ඇත.

එහෙත් එම කාලසීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකර නොමැති බැවින්, එකී *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී පහත උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එන්. කේ. රූපස්සර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| අනු. අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | පටන්ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | මාර්ගයේ දිග (මී.) | මාර්ගයේ පළල (මී.) | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ෆාම් වත්ත පාර | පහළ මුදලිවත්ත | බහායි සෙන්ටර් සිට නාගහමුල දක්වා දිවෙන මාර්ගයේ පාලම අසල සිට | දුම්මලදෙණිය ඇල හරහා සුසාන භූමියට දිවෙන මාර්ගය | | ඩබ්. රත්නායක<br>අයි. පි. පියදාස<br>ඩී. ජී. චන්ද්‍රා ආරියලතා<br>ඩබ්. ඩී. ධම්මිකා හේමන්ති<br>අයි. පී. ප්‍රියන්ත ජයවර්ධන<br>ඒ. රණවීර<br>පී. එම්. ඉලංගකෝන්<br>ඊ. එන්. ජයතිලක | මීටර් 190.00 | මීටර් 2.43 | 3688 |

09 - 84

**යටිනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 මාර්තු මස 09 වැනි දින අංක 2062 දරන පළාත් සභා *ගැසට් පත්‍ර* මඟින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍රය* මඟින් ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, එම *ගැසට්* නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දී ඇත.

එහෙත් එම කාලසීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකර නොමැති බැවින්, එකී *ගැසට්* නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී පහත උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එන්. කේ. රූපස්සර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| අනු අංකය | මාර්ගයේ නම | ග්‍රාම නිලධාරි වසම | පටන්ගන්නා ස්ථානය | අවසන් වන ස්ථානය | වම් පැත්ත | දකුණු පැත්ත | මාර්ගයේ දිග (මී.) | මාර්ගයේ පළල (මී.) | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | හතර වන පටුමග | පහළ මුදලිවත්ත | මුදලිවත්ත සිට දුම්රිය මාර්ගය දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගයේ හතරවන පටුමග පටන් ගන්නා ස්ථානය (ඇල අසල) | දීපාලෝක විහාරස්ථානය දක්වා | එල්. ඒ. සාමකුමාර<br>ඩී. ආර්. විජේරත්න බණ්ඩා<br>කේ. ඒ. පොඩි බණ්ඩා<br>ඩී. ආර්. මුතු මැනිකේ<br>ඩී. ආර්. එස්. එස්. සෙනෙවිරත්න<br>එම්. එස්. පී. අනුලාවති<br>එල්. ඒ. රූපසිංහ<br>එච්. පී. ඩබ්. දිලූෂි වික්‍රමසිංහ | එස්. එම්. පී. වයි. පෝලරාජ්<br>කේ. ඒ. මුතුමැණිකේ<br>කේ. ඒ. ටිකිරි බණ්ඩා<br>කේ. ඒ. මුතුබණ්ඩා<br>ජේ. එල්. හෙක්ටර්<br>කේ. ඩී. ටිකිරි බණ්ඩා<br>ආර්. ජී. විජේදාස | මීටර් 300 | මීටර් 2.43 | 3615 |

09 - 85

**උඩුනුවර ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2063- 2018.03.29 වැනි සිකුරාද දින *ගැසට් පත්‍රය* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍රය* මගින් ප්‍රදේශයේ පොදු ජනතාව මගින් හෝ මංමාවත්වලට අදළ ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, එම *ගැසට්* නිවේදන *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් අතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.

එහෙත් මෙම කාල සීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර කිසිවෙකු ක්‍රියාකර නොමැති බැවින්, එකී *ගැසට්* නිවේදන මගින් ප්‍රකාශයට පත් කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් සියලුම මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**ලියාපදිංචි කළ යුතු මාර්ග නාම ලේඛනය**

| *අනු අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 35 මුරුතගහමුල | කුඹල්අංග පාර | දෙහිපාගොඩ පිටවලවත්තට දිවෙන පාර | එස්. එස්.කේ. වීරසේකර මියට අයත් ඉඩමේ මායිම | 1. එස්. එස්. කේ. වීරසේකර මිය 2. කේ. ජී. රොමාරිස් මයා කුඹල් අංග වත්ත, කුඹල් අංග කුඹුර 3. එම්. එස්. ටී. සෙනෙවිරත්න මිය කුඹල්අංග කුඹුර 4. ජී. ඩබ්. ජේ. ජයසේන මයා -කුඹල්අංග කුඹුර | 1. කේ. ජී. ටී. චන්ද්‍රසිරි මයා -කුඹල්අංග වත්ත 2. කේ. ජී. ඥානවතී මිය - කුඹල්අංග වත්ත 3. කේ. ජී. තෝමස් මයා - කුඹල් අංග කුඹුර 4. ඒ. ජී. එස්. පුෂ්පලතා මිය - කුඹලඅංග ඉඩම | 270 | 8 |
| 2 | 116 අලුත්කන්ද | දුන්ගහ පල්ලම මාර්ගය | ශාන්ත හෙලේනාව ආරාමය | දුන්ගහ පල්ලම | 1. බී. එම්. විජේරත්න මයා 2. එච්. එම්. රත්නායක මයා 3. යූ. ජී. ගුනේරිස් මයා 4. යූ. ලක්සමන් ප්‍රේමසිරි මයා | 1. ඒ. ජී. එන්. සෙනෙවිරත්න මයා 2. ඩී. ජී. එස්. දිල්රුක්ෂි මිය 3. ආර්. ජී. එස්. විජේරත්න මයා 4. ආර්. ජී. විජේරත්න මයා 5. ආර්. ඩබ්. ජී, සෝමා මිය 6. සරත් දොඹගොල්ල මයා | 459.2 | 12 |

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (මීටර්) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 3 | 42 උඩඅළුදෙණිය | උඩපිටිය වත්ත මාර්ගය | වැලිගල්ල තලවතුර මාර්ගය | අංක 153, උඩඅළු දෙණිය වැලිගල්ල නිවස අසලට | 1. ටී. එච්. නිමල් ඇල්ලේවත්ත මයා<br>2. ඩබ්. අනුර පාලිත මයා<br>3. ඩබ්. එම්. ඩී, කේ. වතුපොල මිය<br>4. ඒ. වී. සුනිල් ශාන්ත මයා<br>5. ඩී. ජී. දීප්ති සේනානි මිය | 1. පී. ඩබ්. ජයසූරිය මයා<br>2. එච්. එම්. මුදියාන්සේ මයා | 250 | 8 |
| 4 | 97 කොටගල්ඔළුව | අලකොටුව පාර | හුණුකැටවල මාර්ගය | අලකොටුව වත්ත | 1. කේ. එම්. ජේ ප්‍රේමසාර කුලතුංග මයා | 1. කේ. එම්. අශෝක කුලතුංග මයා<br>2. කේ. එම්. පොඩිමැණිකේ මිය<br>3. කේ. එම්. කිරිමහත්තයෝ මයා<br>4. ඩබ්. ආර්. තනුර වේරගොඩ මයා | 515 | 6 |
| 5 | 04 තලවත්ත | තවත්ත ඉඹුල්අංග මාර්ගය | බෝයගම පාරේ පිහිටි ගල් ක්‍රෑෂර් ළඟ සිට | වී හත්ලාහ දක්වා | 1. එන් එස්. කේ. කරුණාරත්න මයා<br>2. එච්. ජී. තිලකරත්න මයා | 1. ටී. ආර්. කේ. වල්ගම්පාය මයා<br>2. ඒ. එස්. සී. කුලරත්න මයා<br>3. ආර්.ජී. සරත් කුමාරසිංහ මයා | 625 | 10 |
| 6 | 89 කිරිවවුල නැගෙනහිර | කිරිවවුල වැට අස්සවත්ත මාර්ගය | වැලිතැන්න කුඹුර | වැටඅස්ස වත්ත පාර | 1 ඩබ්. ඒ. අනූෂා ජානකී මිය<br>2. ඩී. එම්. එස්. කේ. දිසානායක මයා<br>3. ඒ. ජී. එස්. ගුණරත්න මයා<br>4. අයි. එම්. පින්තු මයා | 1. එස්. ජී. පියුමි නිර්මාණි මිය<br>2. පී. ඒ. වෙරෝනිකා මිය | 400 | 10 |

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (මීටර්) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | 20 මීවතුර | මීවතුර අතුරු මාර්ගය (බෝගහ ගොඩහේන) | බී 12 විශ්ව විද්‍යාල ආචාර්ය වරුන්ගේ නිල නිවස ඉදිරියෙන් | මී වතුර දුම්රිය මාර්ගය අසල | 1. ඩබ්. එම්. ටී. බී. දිසානායක මයා<br>2. වයලට් කස්තුරි ආරච්චි මිය<br>3. එල්. ආර්. බී. රණසිංහ මයා<br>4. එල්. කේ. කේ. රණසිංහ මයා<br>5. එල්. එස්. ඩී. බණ්ඩාර මයා<br>6. ආර්. එම්. ඒ. බණ්ඩාර මයා | 1. ඩී. එම්. එම්. දිසානායක මයා<br>2. එච්. එම්. ටී. රණතුංග මයා<br>3. ආර්. එම්. කේ. රත්නායක මිය<br>4. ඒ. වේලුසාමි මයා<br>5. වයි. එම්. එස්. රත්නායක මයා<br>6. එස්. එම්. රත්නායක මිය<br>7. ඩබ්. එම්. ජේ. බී. ජේ. වික්‍රමසිංහ මයා | 1190 | 8 |
| 8 | අංක 6 බෝයගම | ගනේගොඩ හේන මාර්ගය | පමුණුව ප්‍රධාන මාර්ග යේ සිට | අංක 11 ඉඩම් කට්ටිය | 1. ඒ. එම්. එස්. කේ. අමරකෝන් මයා<br>2. එච්. එම්. එම්.එල්. සෙනෙවිරත්න මයා<br>3. එච්. එම්. ආර්. ආර්. විජේරත්න මයා<br>4. එච්. එම්. කසුන් මධුශංඛ මයා | 1. කේ. ඉන්ද්‍රා මැණිකේ මිය<br>2. කේ. එස්. කේ. සෙනෙවිරත්න මයා<br>3. කේ. ජී. කේසවතී මැණිකේ මිය<br>4. එච්. එම්. කිරිබණ්ඩා මයා<br>5. එච්. එම්. රම්මැණිකේ මිය<br>6. එච්. එම්. සුමනාවතී මිය<br>7. එච්. එම්. පොඩිමැණිකේ මිය<br>8. එච්. එම්. රම්බණ්ඩා මිය | 1020 | පළල අඩි 10ක් හා වංගු සහිත ස්ථානවල පළල අඩි 15 ක් |

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස පදිංචිකරුවන් | දකුණුපස පදිංචිකරුවන් | දිග (මීටර්) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|---|
| 9 | 33 - මීවලදෙණිය | මල්ලංග මාර්යේ සිට වෙලමැද කෘෂි මාර්ගය | මීවලදෙණිය කමත | උඩුපෝටාව වෙල මැද කුඹුර කමත | 1. ආර්. එම්. එස්. කේ. බී. රත්නායක මයා<br>2. සංජීව බණ්ඩාර විජේරත්න මයා<br>3. උමංගා රුක්මාලි විජේරත්න මිය<br>4. අයි. පී. පියදස මයා<br>5. අයි. පී. ටිකිරි බණ්ඩාර මයා | 1. කේ. ජී. එස්. ඩබ්. පෙතියාගොඩ මයා<br>2. සුනිල් චන්ද්‍ර සිල්ලපාන වික්‍රමසිංහ | අඩි 460 | අඩි 8 |

09-121

---

**මාතර මහා නගර සභාව**

2018 මාතර අප ස්වාමි දුවගේ ජාතික සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා මාර්ග වසා තැබීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහා නගර සභා ආඥාපනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, 2017 මාර්තු මස 03 දිනැති අංක 2009 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකර ප්‍රසිද්ධියට පත් කර, මාතර මහා නගර සභාව විසින් වැළඳගන්නා ලද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කෙටුම්පත් කර ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 1811 හා 2013 මැයි 17 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ "වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ" 2 වන වගන්තිය ප්‍රකාරව, මාතර අප ස්වාමි දුවගේ ජාතික සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය පැවැත්වීම හේතුවෙන් 2018 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 සිට 2018 සැප්තැම්බර් 09 වැනි දින පස්වරු 6.00 දක්වා මාතර බස්නැවතුම්පොල අසල රණවිරු පිළිරුව වටරවුම සිට මාතර වෙරළ පාරෙහි අරලිය මාවත දක්වා කොටස, මහා මායා මාවත සහ අරලිය මාවත රථවාහන ධාවනය සඳහා වසා තබනු ලබන බව මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

ඩී. ජී. යසරත්න,
පුරපති,
මාතර මහා නගර සභාව.

2018 අගෝස්තු මස 17 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

09-122

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (01) වැනි වගන්තිය ප්‍රකාරව, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛන යේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම්හිමිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් , මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඉප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව, ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.


**ලියාපදිංචි කළ යුතු මාර්ගය**

| *අනු අංකය* | *ග්‍රාම නිලධාරී වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 74 හියාරාපිටිය | අරච්චාවල පාරේ සිට ගණිත ගෙදර දක්වා මාර්ගය | අරච්චාවල පාර | ගණිත ගෙදර | 1. ඩී. ජී. දයාවතී මිය, කිරිපාමුල්ල කුඹුර<br>2. පී. ජී. රණවීර මයා, කිරිපාමුල්ල කුඹුර<br>3. ජී. ජී. මාග්‍රට් මිය, කිරිපාමුල්ල කුඹුර<br>4. ලසදා රත්වත්තේ මිය, කිරිපාමුල්ල කුඹුර<br>5. බී. ආර්. එම්. කේ. විජේරත්න මයා කිරිපාමුල්ල කුඹුර<br>6. එච්. ජී. ජී. චන්ද්‍රාවතී මිය, කිරිපාමුල්ල කුඹුර<br>7. බී. එම්. ජයතිලක බණ්ඩා මයා, බෝගහපැල්ල කුඹුර | 1. ජී. නන්දවතී මිය, ගණිතගෙදර වත්ත<br>2. එච්. එම්. ඩී. එස්. බී. හේරත් මයා, බෝගහ ඇලවත්ත<br>3. ජී. ජී.සී. කේ. ස්වර්ණලතා මිය, ගණිතගෙදර<br>4. ජී. ජී. ආරියසිංහ මයා, ගණිත ගෙදරවත්ත<br>5. ජී. ජී. මාග්‍රට් මිය, ගණිතගෙදර වත්ත | 200 | 8 |

**W.M.M.ASOKA WIJAYAKOON** *(C.S.S.I.)(FSI)*
***Regd.Licensed Chartered Surveyor** (J.P.)*
***Court Commissioner & Valuer,***
***No. 240/9, Pilimatala Gardens,***
***Pilimatalawa.***
*T.P.No. 081 2575861.*

## PLAN No.3344

*Reference*
*CP - Cement Post*
*MW – Masonry wall*
*ST – Stake / EP – Electric Post*
*FB 99/page 39*




*SCALE – 1 - 1000*

## PLAN

*For a proposea construction of a road of a portion of land called*

***KIRIPAMULLA KUMBURA***

*situate at Hiyarapitiya village in Medapalata of Udunuwara in Hiyaraptiya Grama Niladari area-division no. 74 , in Udunuwara Pradeshiya Sabha and in Udunuwara Divisional Secretarie s Division*

***KANDY DI STRICT***

***CENTRAL PROVINCE***

| Lot No | A | R | P | Hectares |
|---|---|---|---|---|
| 1 | 0 | 0 | 14.9 | 0.03769 |

*NOTE – Udunuwara Pradeshiya Sabha Request No. CPC/UNPS/1/6/MA.Li/7. (08-02-2018)*
*The boundaries for survey pointedout to me by the owners ,*
*Date of Survey – 30 th March 2018.*

***Licensed Surveyor & Leveller***

**W. M. M. ASOKA WIJAYAKOON**
Licensed Surveyor, Leveller
Court Commissioner & Valuer
Pilimatala Gardens - Pilimatalawa

SISL Membership No.1264

09-120

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2018.09.07 | සිකුරාදා | 2018.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.14 | සිකුරාදා | 2018.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.21 | සිකුරාදා | 2018.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.28 | සිකුරාදා | 2018.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2018.10.05 | සිකුරාදා | 2018.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.12 | සිකුරාදා | 2018.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.19 | සිකුරාදා | 2018.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.26 | සිකුරාදා | 2018.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2018.11.02 | සිකුරාදා | 2018.10.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.09 | සිකුරාදා | 2018.10.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.16 | සිකුරාදා | 2018.11.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.23 | සිකුරාදා | 2018.11.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.11.30 | සිකුරාදා | 2018.11.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.